හැටන් - දික්ඔය නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හැටන් - දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

(අ). යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතට නොගැනෙන රු.251,950 ක් වටිනා, විවිධ වත්කම් විෂයයන්ට අයත් භාණ්ඩ ඒකක 181 ක්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). ලී බඩු හා සවිකිරීම් යටතට නොගැනෙන රු.213,147 ක් වටිනා විවිධ වත්කම් විෂයයන්ට අයත් භාණ්ඩ ඒකක 602 ක් ලී බඩු හා සවිකිරීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 06 සිට වසර 25 දක්වා කාල පරාසයක් ගතවී තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතු වටිනාකම රු.13,119,324 ක් විය.

(ආ). ගෙවිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 1 සිට වසර 09 දක්වා කාල පරාසයක් ගතවී තිබුණු රු.306,000 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 26 ක් නිරවුල් කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11,359,537 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම

---

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

| | නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | නගර සභා ආඥා පනත 36 (ඉ) ii වගන්තිය | සමනලගම ප්‍රදේශයේ පිහිටි පර්චස් 46.51 ක ඉඩම් කැබලි 09 ක් දීර්ඝ කාලීනව බදු දීමේදී අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ). | රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥා පනත 217 (2) (vi) වගන්තිය | බදු දෙනලද ඉඩම් වසර 05 කට වරක් තක්සේරු කර කුලී මුදල් සංශෝධනය කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.54,850,010 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,050,988 ක් විය.

2.2 මූල්‍ය පාලනය

---

සභාව රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමක 2017 වර්ෂයේ සෑම මාසයකම රු.32,000,000 කට අධික මුදලක් ශේෂව තිබුණු බව නිරීක්ෂණය වූ අතර, මෙම මුදල් සුදුසු පරිදි උපයෝජනය කිරීමට හෝ වඩා වාසිදායක ලෙස ආයෝජනය කිරීමට හෝ කටයුතුකර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. කෙසේ වුවද එම තොරතුරු එකිනෙක සැසඳීමේදී නොසැසඳීම් පවතින බවද නිරීක්ෂණය විය.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 12,250,000 | 17,671,816 | 15,285,476 | 5,030,602 | 10,200,000 | 6,765,520 | 7,469,615 | 2,527,852 |
| (ii). කුලී | 20,120,000 | 14,692,519 | 14,171,292 | 4,297,588 | 18,204,700 | 16,205,483 | 15,817,168 | 3,521,653 |
| (iii). බලපත්‍ර ගාස්තු | 15,275,000 | 2,318,939 | 2,344,939 | 9,000 | 10,581,000 | 1,797,032 | 1,816,042 | 26,000 |
| (iv). වෙනත් ආදායම් | 18,676,000 | - | 20,486,608 | - | 14,081,000 | - | 19,364,836 | - |

2.3.2 වරිපනම් හා බදු

(අ). වරිපනම්

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.2,527,852 ක හිඟ වරිපනම් බදු මුදලින් වර්ෂය තුළ රු.1,046,079 ක් හෙවත් සියයට 41 ක් පමණක් අයවී තිබුණු අතර, වර්ෂය ආරම්භයේ තිබුණු එම හිඟ මුදලින් රු.1,481,773 ක් වර්ෂය අවසානයේදී අයවිය යුතුව තිබුණි.

(ආ). බිම් බදු

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.841,718 ක හිඟ මුදලින් වර්ෂය තුළ රු.368,488 ක් හෙවත් සියයට 43 ක් පමණක් අයවී තිබුණු අතර වර්ෂය ආරම්භයේ තිබුණු හිඟ මුදලින් රු.473,230 ක් වර්ෂය අවසානයේදී අය විය යුතුව තිබුණි.

2.3.3 කඩකුලී

---------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.2,377,004 ක හිඟ මුදලින් වර්ෂය තුළ රු.856,755 ක් හෙවත් සියයට 36 ක් පමණක් අය වී තිබුණු අතර, වර්ෂය ආරම්භයේ තිබුණු එම හිඟ මුදලින් රු.1,520,249 ක් වර්ෂය අවසානයේදී අයවිය යුතුව තිබුණි.

2.3.4 වෙනත් ආදායම්

-------------------

සභා බලප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය වෙනුවෙන් ගාස්තු අයකර ගැනීමට අදාළව අතුරු ව්‍යවස්ථා සම්මත කරගෙන නොතිබුණු අතර, එම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය වෙනුවෙන් 2017 වර්ෂයට ගාස්තු අයකර ගැනීම සඳහා දැන්වීම් පළකර තිබුණි. කෙසේ වුවද 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දැන්වීම් ප්‍රදර්ශන ගාස්තු ලෙස රු.97,800 ක් ලෙස අයකර තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.15,937 ක් හා මුද්දර ගාස්තු රු.25,091,500 ක් විය.

2.4 අධිභාර

---------

නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 182(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාර අනුව 2017 දෙසැම්බර් 31 දිනට රු.7,924 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු අයවැය ලේඛනයේ, සභා අරමුදල් උපයෝජනය කරගෙන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඇස්තමේන්තුගත වියදම රු.25,229,000 ක් වූ ව්‍යාපෘති 46 ක් ඇතුළත්කර තිබුණි. එහෙත් ඉන් ඇස්තමේන්තුගත වියදම රු.14,299,000 ක් වූ ව්‍යාපෘති 21 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ). ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

2017 වර්ෂයේ සැප්තැම්බර් 10 වන දින කොන්ක්‍රීට් කසළ බඳුන් 75 ක් මිලදීගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් රු.138,750 ක් වැයකර තිබුණි. සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ මෙම කසළ බඳුන් බෙදාදිය යුතු වුවද 2018 මාර්තු 22 දින වනවිට කසළ බඳුන් 67 ක් සභාවේ වාහන අංගනයේ රඳවා තිබුණි. මේ හේතුවෙන් නාගරික බලප්‍රදේශයේ කසළ එකතු කරන ප්‍රමාණය අඩුකර ගැනීමේ හැකියාව ගිලිහීගොස් තිබෙන බවද නිරීක්ෂණය විය.

(ඇ). තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව නගර සභාව දැනුවත් වී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුළ කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ). 1987 – 2017 කාලයට අදාළ විවිධ අත්තිකාරම් රු.452,595 ක් සහ 2008 – 2010 කාලයට අදාළ කර්මාන්ත අත්තිකාරම් රු.2,755,913 ක් වශයෙන් එකතු අත්තිකාරම් රු.3,208,508 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද පියවා නොතිබුණු අතර, මෙම අත්තිකාරම්වලට අදාළ වෙනත් තොරතුරුද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ). සභාවට අයත් වාහන 14 කට අදාළව 2017 වර්ෂයේ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම වාහන 14 වෙනුවෙන් 2017 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඉන්ධන සඳහා රු. 5,316,372 ක සහ අලුත්වැඩියා කටයුතු සඳහා රු.606,973 ක වියදම් දරා තිබුණි. ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම නිසා මෙම ඉන්ධන වියදම් රාජකාරී කටයුතු සඳහා දරන ලද වියදම් බවට විගණනයට සනාථකර ගත නොහැකි විය.

3.3. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 11 ක පැවති පුරප්පාඩු 33 ක් සම්පූර්ණකර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(අ). සභාවට අයත් පර්චස් 1.7 ක ඉඩම් කැබැල්ලක් ගිවිසුමකට එළඹීමකින් තොරව දීර්ඝකාලීනව බඳුදී තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේදී සතුටුදායක ලෙස ගලි සේවාව පවත්වාගෙන ගොස් නොතිබුණු බව විගණනයට ඉදිරිපත්කළ තොරතුරු අනුව නිරීක්ෂණය විය. 2017 ජනවාරි, පෙබරවාරි, මැයි හා දෙසැම්බර් මාස හැර අනෙකුත් මාසවල කිසිදු සේවාවක් සභා

බලප්‍රදේශයේ ජනතාවට ලබාදී නොතිබුණු අතර, එසේ විධිමත් පරිදි එම සේවාව පවත්වාගෙන නොයෑම හේතුවෙන් සභාවට ලබාගත හැකි ආදායමද අහිමිවී තිබුණි.

3.5 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

(අ). පිරිවැය රු.1,300,000 ක් වූ මහේන්ද්‍රා වර්ගයේ කැබ් රථයක් වසර 04 ක පමණ කාලයක් ධාවනයෙන් ඉවත්කර තිබුණු අතර, අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ). පිරිවැය රු.1,000,000 ක්වූ මාර්ග තලනයක් වසර 11 කට අධික කාලයක් භාවිතයෙන් ඉවත්කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 21 සිට සියයට 86 දක්වාද, වියදම් විෂයයන් 05 ක සියයට 19 සිට සියයට 75 දක්වාද, විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2. විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු දෙකක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණ වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ගිණුම්කරණය | ගිණුම් පොත්පත් යාවත්කාලීන නොකිරීම සහ වර්ගීකරණ දෝෂ පැවතීම. |
| වත්කම් | බදුදීමේදී ගිවිසුම්වලට නොඑළඹීම, අනුමැතිය ලබා නොගැනීම සහ තක්සේරු නොකිරීම. |
| තොග | ලේඛන පවත්වා නොතිබීම. |
| ණයගැතියන් | අයකරගත යුතු මුදල් අයකර නොගැනීම. |
| ආදායම් | හිඟ ආදායම් අයකර නොගැනීම. |